# යෝජිත ඉන්දු - ලංකා (සීපා) CEPA ගිවිසුමේ බලපෑම

## සීපා (CEPA) – යනු ?

- විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම් නමින් හැඳින්වෙන වෙළඳ ගිවිසුම් ප්‍රභේදයකි.
- යෝජිත ඉන්දු - ලංකා සීපා ගිවිසුම වසර 2002 සිට මේ දක්වා විටින් විට සාකච්ඡාවට බඳුන් වී ඇත.

## සීපා ගිවිසුම කොටස් 4කින් සමන්විතය.

1. භාණ්ඩ වෙළදාම ලිහිල් කිරීම.
2. සේවා වෙළදාම ලිහිල් කිරීම.
3. ආයෝජන අවස්ථා ලිහිල් කිරීම.
4. දෙරට අතර පුද්ගලයන්ගේ නිදහස් සංක්‍රමණ ලිහිල් කිරීම.

*** සේවා වෙළදාම ලිහිල් කිරීම හා නිදහස් පුද්ගල සංක්‍රමණය ලිහිල් කිරීම සෘජු ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපායි.**

## සේවා වෙළදාම සිදු විය හැකි ක්‍රමවේද 4කි.

1. දේශ සීමා හරහා කෙරෙන සේවා **(Cross Boarder)**
2. අදාල රටට ගොස් සේවය ලබා ගැනීම **(Consumption Abroad)**
3. සේවා සපයන සමාගම අදාල රටට ගොස් සේවා ආරම්භ කිරීම **(Commercial Presence)**
4. නිපුණතා ඇතැයි සැලකෙන පුද්ගලයන් තම සේවය ලබා දීම සඳහා වෙනත් රටකට යාම **(Presence of Natural Persons)**

## ඉන්දියාව සමඟ අතීත වෙළඳ අත්දැකීම්.

- දැනටමත් වසර 15කට ආසන්න කාලයක් ක්‍රියාත්මක ඉන්දු - ලංකා නිදහස් වෙළඳ ගිවිසුම තුලින් ශ්‍රී ලංකාව ලබා ගත් ප්‍රතිලාභයක් නොමැත.
- නිදහස් වෙළද ගිවිසුම ක්‍රියාත්මක වන අතරතුර ඉන්දිය පාර්ශවයෙන් බදු නොවන බාධක අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

  ***උදා :- ඉන්දියාව තුල ප්‍රාන්ත අතර භාණ්ඩ රැගෙන යාමේදී පනවන අමතර බදු හා සීමාවන්.***

## යෝජිත සීපා ගිවිසුම සම්බන්ධ ගැටලු කිහිපයක්

- ගිවිසුමේ සඳහන් කරුණු හෙලිකොට විද්වත් කතිකාවක් සඳහා පරිසරය සකස් නොකිරීම.
- වෘත්තියවේදියා යන්න ඉතා ලිහිල් සේ අර්ථ දක්වා තිබීම.
- ගිවිසුමේ සඳහන් ජාතික සැලකුම (National Treatment) යන කොන්දේසිය අනුව මෙරටට පැමිණෙන ඉන්දියානුවන්ට ශ්‍රී ලාංකිකයන්ට හිමිවන සියලු පුරවැසි අයිතිවාසිකම් වලට හිමිකම ලැබීම.
- මෙරටට එන ඉන්දිය සේවා සපයන්නන් හට තම අඹුදරුවන්ද රැගෙන පැමිණීමට අවස්ථාව විවර වීම.
- වඩා ඉහළ සමාජ ආර්ථික දර්ශක හා ජීවන මට්ටමක් සහිත ශ්‍රී ලංකාව වැනි රටක සිට පහල සමාජ ආර්ථික දර්ශක සහිත ඉන්දියාව වැනි රටකට යාමට ඉදිරිපත් වන වෘත්තියවේදින් ගණන ඉතා අල්ප වෙනු ඇත (පසුගිය වසර තුල ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට ගිය මුලු වෘත්තියවේදින් ගණන 5ක් පමණි).
- ඉන්දියාවේ රැකියා විරහිත ජනගහනය ලංකාවේ මුලු ජනගහනය මෙන් දෙගුණයකි. නිදහස් පුද්ගල සංක්‍රමණයෙන් ඔවුන් උපරිම ප්‍රයෝජන ගනු ඇත.

## සෞඛ්‍ය ක්ෂේත්‍රයට විය හැකි බලපෑම.

- අඩු මුදලට අඩු සුදුසුකම් සහිත ඉන්දිය ජාතිකයන් ශ්‍රී ලාංකික සෞඛ්‍ය ක්ෂේත්‍රය ආක්‍රමණය කරනු ඇත.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සෑම අංශයකම රැකියා අවස්ථා අනතුරට ලක් වනු ඇත.
- ගුණාත්මකභාවයේ ගැටලු තුලින් සමස්ථ ලාංකික සෞඛ්‍ය දර්ශක කෙරෙහි ඍණාත්මක බලපෑමක් එල්ලවනු ඇත.

## අපට කල හැකි දේ.

- ගිවිසුමේ කොන්දේසි පිලිබද දැනුවත් වීම.
- වෘත්තිය සමිති ලෙස සමාජිකත්වය දැනුවත් කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම.
- විධිමත් සාකච්ඡාවන් සඳහා බලධාරින්ට බලපෑම් කිරීම.

**රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය යෝජිත සීපා ගිවිසුමට එරෙහිව වසර 2012 සිට මේ දක්වා අඛණ්ඩව හඩනගා ඇත.**